සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

De Mazenod College Kandana
49028

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I - කොටස

**සැලකිය යුතුය**
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ලෝකයේ කුඩාම මහාද්වීපය වන්නේ,
(1) ආසියාව යි. (2) අප්‍රිකාව යි. (3) ඕස්ට්‍රේලියාව යි. (4) යුරෝපය යි.

02. පෘථිවි භ්‍රමණය සඳහා ගතවන කාලය වන්නේ,
(1) පැය 24 කි. (2) පැය 16 කි. (3) පැය 15 කි. (4) පැය 10 කි.

03. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනයා ජීවත්වන ප්‍රදේශයක් වන්නේ,
(1) කුරුණෑගල ය. (2) මහනුවර ය. (3) හම්බන්තොට ය. (4) හෙන්නානිගල ය.

04. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව පිහිටා ඇති සානුවක් වන්නේ මින් කුමක් ද?
(1) ගලගෙදර (2) කොස්ලන්ද (3) බඹරකන්ද (4) ලුණුගල

05. ගංවතුර ආපදාව බහුලව ම ඇතිවන තෙත් කලාපීය හා වියළි කලාපීය දිස්ත්‍රික්ක දෙක පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) රත්නපුර දිස්ත්‍රික්කය හා පොළොන්නරු දිස්ත්‍රික්කය යි.
(2) අම්පාර දිස්ත්‍රික්කය හා මඩකලපුව දිස්ත්‍රික්කය යි.
(3) කොළඹ දිස්ත්‍රික්කය හා මාතර දිස්ත්‍රික්කය යි.
(4) පොළොන්නරුව දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කය යි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති වචන අතරින් සුදුසු පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

(ග්‍රිනිච්, පෝක්, සීගිරිය, සිරස්ව, සූචකය, ජාත්‍යන්තර දින රේඛාව, තොටපොල, ජලවහනය)

06. ........................................ යනු වියළි කලාපය තුළ පිහිටා ඇති ශේෂ කන්දකි.

07. සිතියමක් කියවීම සඳහා ........................................ අත්‍යවශ්‍ය වේ.

08. දේශාංශ $0^0$ .............................. රේඛාව ලෙස හඳුන්වනු ලැබේ.

09. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ ........................................ සමුද්‍ර සන්ධියෙනි

10. තෙත් කලාපය තුළ භූමිය සීමිත බැවින් ........................................ ගොඩනැගිලි ව්‍යාප්තවී තිබේ.

- අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (නි) අක්ෂරය වටා ද, වැරදි නම් (වැ) අක්ෂරය වටා ද රවුමක් අඳින්න.

11. අපේ රට ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් වුවද සමාජයීය සංවර්ධනය අතින් ඉහළ මට්ටමක් හිමිකර ගෙන තිබේ. ( නි / වැ )

12. සෑම වෙරළබඩ රාජ්‍යයකම වෙරළ මායිමේ සිට නාවික සැතපුම් දොළහක සීමාව රාජ්‍යීය මුහුදු සීමාවට අයත් වේ. ( නි / වැ )

13. ලෝක උරුමයක් ලෙස පිළිගෙන ඇති ගාලු කොටුව ස්වභාවික නිර්මිතයකි. ( නි / වැ )

14. මහාද්වීප ආසන්නයේ හා අභ්‍යන්තර ප්‍රදේශවල පිහිටා ඇති කුඩා ජලතල ප්‍රදේශ සාගර ලෙස හැඳින්වේ. ( නි / වැ )

15. පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී ශ්‍රී ලංකාවේ වියළි කාලගුණයක් පවතී. ( නි / වැ )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසේ තේමාවට ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා එයට හිමි ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.

| (අ) | (ආ) |
|---|---|
| 16. භූගත ජලය බහුලව භාවිතා කරමින් වගා කටයුතු සිදු කරයි. | A ආපදා අවස්ථාව (........) |
| 17. අවදානම් කලාප හඳුනා ගැනීම හා එම ස්ථානවලින් ජනතාව ඉවත් කිරීම. | B ගෝලීය දේශගුණික වෙනස්වීම් නිසා සිදුවේ. (........) |
| 18. අපේ රටේ දර්ශනීය වෙරළ තීරයකි. | C පෙර සූදානම (........) |
| 19. අනතුරට ලක්වූවන්ට වෛද්‍ය ආධාර හා ප්‍රතිකාර ලබාදීම. | D නිලාවෙලි (........) |
| 20. මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා වෙරළබඩ පරිසර පද්ධති විනාශ වීම. | E යාපනය අර්ධද්වීපය හා ඒ අවට දූපත් (........) |

(ලකුණු $2 \times 20 = 40$)

සැලකිය යුතුය

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01. (අ) ඔබට සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට අදාළ පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන මහාද්වීපය (යුරෝපය / අප්‍රිකාව)
(ii) B අක්ෂරයෙන් දැක්වෙන සාගරය (අත්ලන්තික් / පැසිෆික්)
(iii) C අක්ෂරයෙන් දැක්වෙන රට (සුඩානය / දකුණු අප්‍රිකාව)
(iv) D අක්ෂරයෙන් දැක්වෙන දූපත (ජපානය / නවසීලන්තය) (ලකුණු 2 × 4 = 8)

(ආ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.




(i) E අක්ෂරයෙන් දැක්වෙන තුඩුව (දෙවුන්දර තුඩුව / පේදුරු තුඩුව)
(ii) F අක්ෂරයෙන් දැක්වෙන කලපුව (මීගමුව කලපුව / මඩකලපුව)
(iii) G අක්ෂරයෙන් දැක්වෙන දූපත (ඩෙල්ෆ්ට් / කයිට්ස්)
(iv) H අක්ෂරයෙන් දැක්වෙන ගංගාව (දැදුරු ඔය / කලා ඔය) (ලකුණු 2 × 4 = 8)

02. (i) පෘථිවියේ, ජලය හා ගොඩබිම ව්‍යාප්තිය ප්‍රතිශත වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) (a) ලොව විශාලත සාගරය හා කුඩාම සාගරය පිළිවෙළින් ලියන්න. (ලකුණු 2)

(b) මහාද්වීප අභ්‍යන්තරයේ පිහිටි මුහුදු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) අධික අවුරුද්දක් උදාවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

03. (i) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියමේ (2) හා (3) අංක මගින් දැක්වෙන ප්‍රධාන භූ විෂමතා කලාප දෙක නිවැරදිව නම් කරන්න. (ලකුණු 2)




(ii) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ලකුණු 4)

(iii) පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් අපේ රටට ලැබෙන සංවහන වර්ෂාව පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 5)

- වර්ෂාව ලැබෙන කාලය
- වර්ෂාව ලැබෙන ප්‍රදේශය
- විශේෂ ලක්ෂණ

04. (i) දකුණු ආසියානු කලාපයට අයත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවර්ග අතරින් ජනවර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) අපේ රටේ පාසල් දරුවන්ගේ අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) "ජාතික උරුම මගින් රටක අනන්‍යතාව විදහා දැක්වේ". අපේ රටේ ජාතික උරුම ආරක්ෂා කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

05. (i) භූගත ජලය යොදා ගෙන සිදුකරන වගාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (a) තෙත් කලාපීය භූ දර්ශනයනය තුළ පිහිටි ගංගා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(b) වෙරළ ආශ්‍රිතව දක්නට ලැබෙන භූ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

2025 . 01    ශ්‍රේ. 07 .

(iii) කඳුකර හූ දර්ශනයක් සහිත කලාපවල දක්නට ලැබෙන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

48979

06. (i) සුනාමි ආපදාව ඇතිවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) පහත රූප සටහන් මඟින් දැක්වෙන ස්වාභාවික ආපදා වර්ග නිවැරදිව නම් කරන්න. (ලකුණු 4)



A. ..............................................................



B. ..............................................................



C. ..............................................................



D. ..............................................................

(iii) ආපදා මඟින් සිදුවන අනතුරු වළක්වා ගැනීම හෝ අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

07. (i) (a) ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් නිර්මාණය කරනු ලබන්නේ කුමන දෙපාර්තමේන්තුව විසින් ද? (ලකුණු 1)

(b) ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියමක් නිර්මාණය කිරීමේ දී යොදා ගන්නා පරිමාණය කුමක් ද? (ලකුණු 1)

(ii) භූ ලක්ෂණ සිතියමක දැකිය හැකි මූලිකාංග හතරක් ලියන්න. (ලකුණු 4)

(iii) සිතියමක් පිටලස් කරන ආකාරය පියවර ලෙස ලියා දක්වන්න. (ලකුණු 5)

Learning Resource Center
R
De Mazenod College
Kandana